"දකුණේ සිංහලයා පරාජය කිරීමට සජිත්ට ඡන්දය දෙන්න" යනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී සුමන්දිරන් විසින් පැවසුවේයැයි දැක්වෙන සිරස්තලයකින් යුත් ප්‍රවෘත්තියක් අරුණ පුවත්පතේ පළ වූ අතර, සමාජ මාධ්‍ය ජාලයන් ඔස්සේද ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී සුමන්දිරන්ට දැඩි විවේචනයන් එල්ල වී තිබිණි. එම ආන්දෝලනය සමගින් අප එහි සත්‍යාසත්‍ය භාවය විමසා සිටි අතර, මෙම සිරස්තලය සහ අන්තර්ගතයේ තිබූ "ගෝඨාභය රාජපක්ෂ දිනවීමේ දකුණේ සිංහල ජනතාවගේ හා සිංහල නායකයන්ගේ ජයග්‍රහණය නැවැත්වීම වෙනුවෙන් දෙමළ ජනතාව එක්ව කටයුතු කළ යුතුයි" යන වාක්‍යය තමන් කිසිදු තැනකදී ප්‍රකාශ නොකළ බවට පාර්ලිමේන්තු මන්ත්‍රී සුමන්දිරන් විසින් අප කළ විමසීමේදී ප්‍රකාශ කරන්නට යෙදිණි. මෙය අප විසින් පෙන්වා දී ඇත.

කෙසේ හෝ මවුබිම සහ සිලෝන් ටුඩේ පුවත්පත්ද මෙය ඉන් පසුව ඒ ආකාරයෙන්ම පළ කර ඇති බව අපට නිරීක්ෂණය කරන්නට හැකි විණි. ඉහත සඳහන් කළ සිරස්තලය සහ අන්තර්ගතයේ වන වැකිය ඒ ආකාරයෙන්ම මවුබිම පුවත්පතේ සඳහන් වන අතර, සිලෝන් ටුඩේ හි එහි ඉංග්‍රීසි පරිවර්තනය දක්නට ලැබේ.

සාවද්‍ය තොරතුරු ප්‍රකාශයට පත් කිරීම සහ කිසිවෙකු විසින් නොපැවසූ යමක් පැවසුවායැයි සඳහන් කරමින් කරුණු සමාජගත කිරීම බරපතල මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් බව අපි මින් පෙරද අවධාරණය කළෙමු. එසේම විශේෂයෙන් රටක පැවැත්වෙන ජනාධිපතිවරණයක් වැනි තීරණාත්මක මොහොතකදී මෙවන් සාවද්‍ය පුවත් පළ කරමින්, ජනවර්ගයන් අතර පවා ගැටළු ඇති විය හැකි ආකාරයෙන් ක්‍රියා කිරීම ජනමාධ්‍යයකට තරම් නොවෙනා, ජනමාධ්‍ය ආචාර ධර්මයන්ට පටහැණි හැසිරීමක් බව අපි මෙසේ සටහන් කරමු.

#mediaethicsSL #SinhalaPress #Englishpress #lka #Mawbima #CeylonToday